රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 13/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1988 අප්‍රේල් මස 18 වැනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## ශිෂ්‍යත්ව මත විදේශ ගමන් සඳහා සීමිත ගමන් බලපත්‍ර නිකුත් කිරීම

විදේශ ශිෂ්‍යත්ව ප්‍රදානයක් ලබාගත් රජයේ නිලධාරියෙකුට එම ශිෂ්‍යත්ව කාලයට පමණක් වලංගු වන සීමිත විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කළ යුතුය.

02. විදේශ ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවන දැන්වීමෙහි ශිෂ්‍යත්වය සඳහා තෝරාගනු ලැබුවහොත්, රජයේ නිලධාරියා සතු ගමන් බලපත්‍රයක් ඇති නම්, එය ආගමන හා විගමන පාලක වෙත හෝ ශිෂ්‍යත්ව ප්‍රදාන අධිකාරිය වෙත හෝ භාරදිය යුතු බවත්, ඒ වෙනුවට ශිෂ්‍යත්ව කාලයට පමණක් වලංගු වන සීමිත ගමන් බලපත්‍රයක් ඔහුට නිකුත්කෙරෙන බවත් දැනුම් දිය යුතුය. සීමිත ගමන් බලපත්‍රයක් නිකුත් කරන බව අපේක්ෂිත ඉල්ලුම්කරුවන්ට මෙසේ කලින් දැනුම් දීම අත්‍යවශ්‍යයෙන් කළ යුතුය.

03. ශිෂ්‍යත්ව ප්‍රදානය කරන අධිකාරිය ශිෂ්‍යත්ව ප්‍රදානයේ කාලය දැක්වෙන ආවරණ ලිපියක් ද සමග එවැනි සීමිත විදේශ ගමන් බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය ආගමන හා විගමන පාලක වෙත ඉදිරිපත් කළයුතුය.

04. එම ගමන් බලපත්‍රය වලංගු වන්නේ එහි නිශ්චිතව දක්වා ඇති කාලයට පමණක් බවට සටහනක් තබා, ආගමන හා විගමන පාලක ශිෂ්‍යත්වයක් සඳහා තෝරාගනු ලබන නිලධාරියාට සීමිත ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ඇත. කෙසේ වෙතත්, මෙම සීමාව ශිෂ්‍යත්ව කාලයේ මුලින් හා අගින් අමතර මාස තුනක් බැගින් වලංගු කිරීමට හැකිවන පරිදි වනු ඇත.

05. සීමිත ගමන් බලපත්‍රයක් හිමි අයෙකු ශිෂ්‍යත්ව කාලය අවසන්වීමට පෙර ආපසු පැමිණීමට කැමැත්ත දක්වන්නේ නම් ඔහුට එසේ කළහැකි වන අතර, අධ්‍යාපන කටයුතු තවදුරටත් කරගෙන යෑම සඳහා නැවතත් විදේශ ගතවීමට බලාපොරොත්තු වන්නේ නම්, ඔහු ආගමන හා විගමන පාලක වෙතින් ඉතිරි කාලය සඳහා අළුත් සටහනක් ලබාගත යුතු වන්නේය. ගමන් මාර්ගයේ ඇති රටවලට ඇතුළුවීමට අවසර දෙන එක් ගමනක් සඳහා වූ ගමන් බලපත්‍රයක් ද ආගමන හා විගමන පාලකට නිකුත් කළ හැකිය.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,